

## ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

# පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - 2024

ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සැලසුම්කර ඇති ඉහත දැක්වෙන පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අධ්‍යාපන නිලධාරීන්, ගුරුවරුන්, ගුරු අධ්‍යාපනඥයින්, විදුහල්පතිවරුන්, ගුරු සිසුන්, විශ්වවිද්‍යාල සිසුන් සහ පර්යේෂණ සඳහා ලැදියාවක් දක්වන්නන් සඳහා මෙම පාඨමාලාව ඉලක්ක කෙරේ. මෙම පාඨමාලාව අර්ග 05ක් (05 Credits) සහිත වන අතර, ප්‍රායෝගික සම්මුඛ සැසි මගින් සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ දී පැවැත්වේ.

### පාඨමාලාවේ අන්තර්ගතය

- පර්යේෂණ යෝජනාවක් පිළියෙළ කිරීම
- සාහිත්‍ය විමර්ශනය
- පර්යේෂණ පිරිසැලසුම තෝරා ගැනීම
- දත්ත රැස් කිරීමේ ක්‍රම
- දත්ත විශ්ලේෂණ ක්‍රම
- විද්‍යාත්මක පර්යේෂණ වාර්තා ලිවීම

**කාල සීමාව :** මාස 06 (මාසයකට සති අන්ත දින 02කි.)

| | |
|---|---|
| අයදුම් පත්‍ර ගාස්තුව | : රු. 200.00 |
| ලියාපදිංචි ගාස්තුව | : රු. 1000.00 |
| සම්පූර්ණ පාඨමාලා ගාස්තු | : රු. 30,000.00 (සමාන වාරික 03කින් ගෙවීම් කළ හැකිය.) |

## විමසීම්


| | |
|---|---|
| **අධ්‍යක්ෂ (පර්යේෂණ)** | : 0117 - 601790 |
| **සම්බන්ධීකාරක** | : **(සිංහල මාධ්‍ය - එම්. ඩී. ඩී. අයිරානි ද සිල්වා මෙනවිය)** |
| **විද්‍යුත් තැපැල** | : **iraniemdd@gmail.com / Tel:** 0117 601 863 / 071 519 6894 |
| **සම්බන්ධීකාරක** | : **(දෙමළ මාධ්‍ය - වී. අගල්යා මිය)** |
| **විද්‍යුත් තැපැල** | : **agalyavino29@gmail.com / Tel:** 0117 601 794/ 077 314 4962 |


1.0 **ඉල්ලුම් කළ යුතු පිළිවෙළ**

අයදුම්කරුවන් ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට පිවිස https://www.exams.nie.lk/intakes/new යොමුව ඔස්සේ මාර්ගගත ව පමණක් අයදුම්පත්‍ර යොමු කළ යුතු ය. මාර්ගගත ව අයදුම්පත් යොමු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් පහත යොමුව මගින් ලබා ගත හැක. https://www.exams.nie.lk/info/applying-for-new-enrollments

**අයදුම්පත් සම්පූර්ණ කළ යුතු ආකාරය**

exams.nie.lk/intakes/new වෙබ් අඩවියට ඇතුළත් වී (Sign up) අදාළ තොරතුරු සම්පූර්ණ කරන්න. (Sign up) සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් පහත යොමුව මඟින් ලබාගත හැක exams.nie.lk/info/register-as-a-user පරිශීලක අංකය (User ID) සටහන් කර ගන්න. අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා මුරපදය (Password) මතක තබා ගන්න.

2.0 වෙබ් අඩවියේ දකුණු පස ඉහළ දැක්වෙන කොටු දෙකෙහි පරිශීලක අංකය හා මුරපදය යොදා ඇතුළත් වන්න. (Login)

2.1 ඔබ පිළිබඳ තොරතුරු පත්‍රිකාව (User Profile) යාවත්කාලීන (Update) කරන්න.

- ➢ පෞද්ගලික තොරතුරු
- ➢ සේවා තොරතුරු
- ➢ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

2.2 අනතුරුව exams.nie.lk/new_intake **Certificate Course in Research Methodology** පාඨමාලාවට අදාල My application තෝරා තොරතුරු නිවැරදිව ඇතුලත් කර එය නැවත පරීක්ෂාකර අයදුම් පත්‍රය යොමු කරන්න. (අවශ්‍ය උපදෙස් පහත යොමුව මඟින් ලබාගත හැක. exams.nie.lk/info/applying-for-new-enrollments)

2.3 ඔබට ලැබෙන අයදුම්පත් පරිශීලක අංකය (Application Reference Number) සටහන් කර තබා ගන්න.

අයදුම්පත බාගත කිරීම (Download Application)

මාර්ගගත (Online) අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් පසුව ඔබගේ යොමු අංකය (Reference Number) සමඟ ලැබෙන විස්තර ඇතුළත් පිටපත මුද්‍රණය කර, එය ආයතනික ප්‍රධානියා මගින් සහතික කරවා ගෙන, මුදල් ගෙවන ලද රිසිට් පතෙහි මුල් පිටපත සමඟ **2024 මාර්තු 15** වන දින හෝ ඊට පෙර **අධ්‍යක්ෂ, පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**පර්යේෂණ ක්‍රමවේද පිළිබද සහතික පත්‍ර පාඨමාලාව - 2024**" යනුවෙන් සඳහන් කළ යුතු ය.

**සැලකිය යුතුයි -**

- සියලුම ගාස්තු ගෙවීම් බැංකු කාඩ්පත් මගින් (Credit හෝ Debit) සිදු කළ හැකි ය.
- මාර්ගගත ගෙවීම් සිදු කිරීමේ දී ලැබෙන රිසිට්පතෙහි පිටපත හෝ බැංකු ශාඛාවකට ගෙවීම් සිදු කිරීමේ දී ලැබෙන රිසිට්පතෙහි මුල් පිටපත අයදුම් පත්‍රයට ඇමිණීම අනිවාර්ය වේ.
- තාක්ෂණික සහාය සඳහා 0117 601 777 / 0117 601 776, දුරකථන අංකවලට ප.ව. 2.00 සිට ප.ව. 4.00 දක්වා අමතන්න.

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.